(ඉගෙනුම් කාලය :- පැය 2 )

# 07. සාධක

## 7.1 සංඛ්‍යා කිහිපයක මහා පොදු සාධකය

- යම් සංඛ්‍යාවක් පූර් ණ සංඛ්‍යා දෙකක ගුණිතයක් ලෙස ලියූ විට එම සංඛ්‍යා, මුල් සංඛ්‍යාවේ **සාධක** ලෙස හැඳින්වේ.
- සංඛ්‍යා දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යා කිහිපයක සියලු පොදු සාධක අතුරින් විශාලතම පොදු සාධකය, එම සංඛ්‍යාවන්ගේ **මහා පොදු සාධකය (ම.පො.සා.)** වේ.
- 7 ශ්‍රේණියේදී ඔබ සාධක පාඩමේ ඉගෙනගත්, එක් එක් සංඛ්‍යාව ප්‍රථමක සංඛ්‍යාවල ගුණිතයක් ලෙස ලිවීමෙන් ම.පො.සා. සොයන ආකාරය සිහිපත් කරගෙන පුනරීක්ෂණ අභ්‍යාසය කරන්න.

## 7.2 වීජීය පද කිහිපයක මහා පොදු සාධකය

$4x$, $8xy$ සහ $6xyz$ යන වීජීය පදවල ම.පො.සා. සොයමු.

එක් එක් පදය සාධකවල ගුණිතයක් ලෙස ලියමු.

$$4x = 2 \times 2 \times x$$
$$8xy = 2 \times 2 \times 2 \times x \times y$$
$$6xyz = 2 \times 3 \times x \times y \times z$$

මෙහි දී, එක් එක් වීජීය පදයේ සංගුණකය ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ද අඥාතයන් වෙන් කර ගුණිතයක් ලෙස ද මෙහි දැක්වෙන ආකාරයට ලියනු ලැබේ.

$4x$, $8xy$ සහ $6xyz$ යන වීජීය පද තුනට ම පොදු සාධක වන්නේ 2 සහ $x$ වේ.

$4x$, $8xy$ සහ $6xyz$ යන වීජීය පදවල ම.පො.සා. වන්නේ මෙම සියලු වීජීය පදවල ම පොදු සාධකවල ගුණිතයයි.

$\therefore$ $4x$, $8xy$, සහ $6xy$ හි ම.පො.සා. $= 2 \times x$
$= 2x$

- පිටුවේ නිදසුන් අධ්‍යයනය කර 7.1 අභ්‍යාසය කරන්න.

## 7.3 වීජීය ප්‍රකාශනයක් එහි සාධකවල ගුණිතයක් ලෙස ලිවීම

- පළමුව වීජීය ප්‍රකාශනයේ පදවල මහා පොදු සාධකය සොයන්න.
- ම.පො.සා. එක සාධකයක්ද එම සාධකයෙන් වීජීය ප්‍රකාශනයේ එක් එක් පදය බෙදීමෙන් ලැබෙන ප්‍රකාශනය අනිත් සාධකය ලෙසද ගන්න.
- වීජීය ප්‍රකාශනය එම සාධකවල ගුණිතයක් ලෙස ලියන්න.
- 85 පිටුවේ නිදසුන් අධ්‍යයනය කර 7.2 අභ්‍යාසය කරන්න.